# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1518 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 27/09/2024<br>පැය 1715 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂක නිලධාරින් ඉවත් කිරීම - පොලිස් මූලස්ථානය.**

2024.09.24 දින මධ්‍යම රාත්‍රියේ ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද බැවින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කළ සියළුම අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තුව නියෝජනය කළ අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ ධූර එදින පටන් අවලංගු වේ. එබැවින් ශ්‍රී ලංකා පොලිසිය මගින් එකී ප්‍රභූන්ගේ ආරක්ෂාවට ලබා දී තිබූ ප්‍රභූ ආරක්ෂක නිලධරයන් සහ මින් පෙර පාර්ලිමේන්තුව නියෝජනය කළ අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන්, හිටපු ආණ්ඩුකාරවරුන්, පළාත් සභා නියෝජනය කළ හිටපු අමාත්‍යවරුන් හා මන්ත්‍රීවරුන් වෙත ලබා දී තිබූ ප්‍රභූ ආරක්ෂක නිලධාරීන් ඉවත් කිරිමට ක්‍රියා කර ඇත.

පහත සදහන් ප්‍රභූන්ගේ ආරක්ෂක ඒකක වෙත පමණක් මේ වන විට ලබා දී ඇති ආරක්ෂාව තවදුරටත් නොවෙනස්ව ලබා දීමට නියමිතය.

- ගරු කථානායකතුමා,
- ගරු විපක්ෂ නායකතුමා,
- ගරු නියෝජ්‍ය කථානායකතුමා,

එසේම වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ පනත අනුව හා අධිකරණ නියෝගයක් මත විශේෂ ආරක්ෂාව ලබා දිය යුතු බවට නියෝග කර ඇති පාර්ලිමේන්තුව නියෝජනය කළ හෝ පළාත් සභාව නියෝජනය කළ හෝ ආණ්ඩුකාර ධූරය දැරූ කිසියම් ප්‍රභූවරයෙකු සිටීනම් ඔවුන් වෙත පමණක් ලබා දී ඇති ආරක්ෂාව තවදුරටත් නෙවෙනස්ව ලබා දෙනු ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**